# බළන්ගොඩ නගර සභාව

## 2021-06-25 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.06.25**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ආ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 16. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්.එච්.ජී.කරුණාරත්න මිය

**01. පසුගිය මහ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියලු දෙනා පිළිගැනීමෙන් අනතුරුව 2021-05-06 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් 2021-05-06 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අවස්ථාවේදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් තමන් පසුගිය මහ සභාවේදී ඉදිරිපත් කළ 05ඃ01ඃ44 යෝජනාව සඳහා තමන් විරුද්ධ වූ අතර එය සටහන්ව නොමැති බැවින් එය සටහන් කරන ලෙස පවසන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් පසුගිය මහ සභා වාර්තාවේ 22 පිටුවේ තමන් විසින් දක්වා ඇති අදහස්වලට ගරු සභාපතිතුමා විසින් ලබා දුන් පිළිතුරු සටහන්ව නොමැති බැවින් එය සටහන් කරන ලෙස පැවසීය.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තාව ගරු සභාවේ සම්මත විය.**

02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන

- පවත්නා කොවිඩ් 19 වසංගතය හමුවේ ඉතාම කෙටි වේලාවකින් සභාවේ කටයුතු අවසන් කරන ලෙස දැනුම් දී ඇති අතර, පවත්නා වසංගත තත්ත්වය තුල රෝගීන් සමාජයෙහි සිටියද හඳුනා ගත නොහැකි තත්ත්වයක් උදා වී ඇති බවද සභාවේ අත්‍යවශ්‍ය කටයුතු කඩිනමින් අවසන් කරන ලෙසද පවසන ලදී.
- එමෙන්ම එක්සත් ජාතික පක්ෂ නායක මෙන්ම තම නායක හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් දිවුරුම් දීම පිළිබඳ තමන්ගේ හා ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමාගේ සුභාෂිංශනය එක් කරන බව පවසන ලදී.
- තමන්ගේ බලවත් ඉල්ලීම අනුව බළන්ගොඩ ප්‍රදේශයේ ඇති පළාත් පාලන ආයතන තුනෙහි නිළධාරීන් සඳහා අවශ්‍ය එන්නත් ලබා දීම පිළිබඳ ගරු සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිතුමියට හා සබරගමුව පළාත් ආණ්ඩුකාරතුමාට තම ස්තූතිය පළ කරන ලදී.

- බළන්ගොඩ නගර සභාවේ ව්‍යාපෘති තුනක් සඳහා වෙන් වූ රුපියල් ලක්ෂ 180 කට ආසන්න මුදල හදිසියේ අත්හිටුවා ලිපියක් එවා ඇති බව ද සබරගමුව පළාතේ අනෙකුත් සියලුම පළාත් පාලන ආයතනවල ව්‍යාපෘති කටයුතු ආරම්භ කර ඇති නමුත් බළන්ගොඩ නගර සභාවේ පමණක් එම ව්‍යාපෘති අත්හිටුවා ඇති බව ද මෙම ව්‍යාපෘති බළන්ගොඩ නගර සභාව වෙත හිමි වූ අවස්ථාවේදී එක් කණ්ඩායමකට ප්‍රශ්නයක් තිබූ බවද පවසන ලදී. එබැවින් බළන්ගොඩ නගරයට හා ජනතාවට අත්‍යවශ්‍ය මෙම ව්‍යාපෘති තුන අත්හිටුවීම සඳහා ක්‍රියා කර සමාජයට එය නොපෙන්වා සතුටු වන්නේනම් ඒ වෙනුවෙන් තම කණගාටුව පළ කරන බවද පවසන ලදී. විශේෂයෙන් පොදු වෙළෙඳසැල අවුරුදු 60 කට වැඩි කාලයක් පැරණි ගොඩනැගිල්ලක් වන අතර, එය දිරාපත්ව පවතින බව ද පාරිභෝගිකයින්ට හා ව්‍යාපාරිකයින්ට එහි රැඳී සිටීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බවද පැවසූ ගරු සභාපතිතුමා එය අලුත්වැඩියා කිරීම සඳහා රුපියල් ලක්ෂ 96 ක මුදලක් ද පොදු වෙළෙඳසැල පිටුපස ළමා උද්‍යානයට අවශ්‍ය වැසිකිළි පද්ධතිය අලුතින් ඉදි කිරීම සඳහා රුපියල් ලක්ෂ 18 ක මුදලක්ද තුරු උයන සංචාරක නිදහස් කලාපයක් හා ගිමන් හරින ප්‍රදේශයක් බවට පත්කිරීම සඳහා ලක්ෂ 66 ක මුදලක්ද මෙසේ වෙන් කර තිබූ නමුත් බළන්ගොඩට අත්‍යවශ්‍ය යෝජනා වන මෙම ව්‍යාපෘති තුනම කවුරුන් හෝ තමන්ගෙන් පළි ගැනීමට නවතා ඇති බව ද බළන්ගොඩ ජනතාවගේ හිමිකම් නැති කිරීම පිළිබඳ තමන් කණගාටු වන බවද පවසන ලදී. එමෙන්ම ජනතා නියෝජිතයින් ලෙස ජනතාව විසින් බළන්ගොඩ නගර සභාවට මෙම කණ්ඩායම පත්කර එව්වේද බළන්ගොඩින් පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පත් කර යැව්වේද බළන්ගොඩට අවශ්‍ය සංවර්ධනය රැගෙන ඒමට මිස මෙවැනි ව්‍යාපෘති කඩාකප්පල් කිරීමට නොවන බවද මෙම ව්‍යාපෘති තුන නැවත සභාව වෙත ලබා ගැනීම සඳහා තමන් උපරිම උත්සහයක යෙදෙන අතර ඒ සඳහා සියලු දෙනාගේම සහයෝගය ලබා දෙන ලෙසද පවසන ලදී.
- මේ වන විට අප රටේ ඉන්ධන මිළ ඉතාමත් අසාධාරණ ලෙස ඉහළ දමා ඇති නිසා ගොවි ජනාතාවට අවශ්‍ය කරන පොහොර ලබා ගැනීමට නොහැකි වී ඇති බව ද අතිගරු ජනාධිපතිතුමා විසින් ආරම්භ කළ කාබනික පොහොර හඳුන්වා දීමේ වැඩසටහනට තමන් එකග අතර වස විසෙන් තොර රටක් වෙනුවෙන් මූලික ආරම්භයක් ගත යුතු නමුත් මෙම ක්‍රියාමාර්ගය දෑඩි බවද පවසන ලදී. විශේෂයෙන් පවත්නා කෙවිඩ් 19 වසංගතය හමුවේ හා ආර්ථික අවපාතය හමුවේ මහජනතාව කබලෙන් ලිපට ඇද දමා ඇති බැවින් මේ සියලු දේ ජනතාවට සහනයක් වන පරිදි සකස් කර දෙන ලෙස රජයෙන් ඉල්ලා සිටින බව පවසන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ජනතාව ජීවන බරින් පීඩිතව සිටින අවස්ථාවකදී ඉන්ධන මිළ ඉහළ දැමීමට විරුද්ධව සභාවේ බෝඩ් ප්‍රදර්ශනය කරමින් විනාඩි 05 ක විරෝධතාවක් දැක්වීම සඳහා අවස්ථාවක් ඉල්ලා සිටි අතර, ඒ අනුව එම්. ඩබ්. විමලසිරි මැතිතුමා, රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා, පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය හා සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය යන ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා විසින් සභාවේ නිහඬ විරෝධතාවයක් දක්වන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා**

මෙම නිහඬ විරෝධතාවයෙන් පසුව අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් 2015 ට පෙර මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලවකවානු දෙක තුල මෙරට යුද්ධය අවසන් කර ගුවන් තොටුපළවල්, වරායවල්, මහා මාර්ග සකස් කර ආර්ථික වර්ධනය 6.5% ට නඟා සිටුවීමට කටයුතු කළ නමුත් එතුමාගෙන් පසු 2015 වර්ෂයේදී යහ පාලන ආණ්ඩුව විසින් එම ආර්ථික වර්ධනය 2.5% ක් දක්වා පහළ දමූ අතර කිසිම වසංගතයක් නොමැති කාලයක් තුළ ආර්ථික වර්ධන වේගය නැංවීමට නොහැකිව මහ බැංකුව මහ දවල් හොරා කා මේ රට විනාශ කළ නිසා හැට නව ලක්ෂයක් ජනතාව අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙත ඡන්දය ලබා දුන් බවද පවසන ලදී. රටේ වසංගතයක් පවතින අවස්ථාවක මෙරටට විදේශ විනිමය නොලැබෙන්නේ නම් සංචාරකයින් නොඑන්නේ නම් විදේශ ශ්‍රමිකයින් මුදල් නොඑවන්නේ නම් තෙල් මිළ වැඩි නොකරන්නේ කෙසේද යන්නත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව රජය පාලනය කරානම් කොහොමද කියා මහජනතාව දන්නා බවත් වැඩිදුරටත් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් තෙල් මිළ ඉහළ දැමීම නිසා ජනතාව අපහසුතාවයට පත් වීම පිළිබඳ කණගාටු වන බව පැවසීය.

ඒ අනුව රටේ ජනතාව සඳහා රුපියල් 5000.00 ක දීමනාව ලබා දෙමින් රජය විසින් විශාල වියදමක් දරන බව ද ලක්ෂ 15කට ආසන්න රාජ්‍ය සේවකයින් නිවසේ සිට වැටුප් ලබන බවද ලක්ෂ 26 කට ආසන්න ප්‍රමාණයකට මේ වන විට එන්නත් ලබා දී ඇති අතර තවත් එන්නත් ලක්ෂ 40 ක් ගෙන්වීමට නියමිත බවද එබැවින් මෙවැනි දෙයක් වෙනුවෙන් විරෝධතාවයක නිරත වීම පිළිබඳ තමන් කණගාටුවට පත් වන බවත් මෙවැනි අවස්ථාවක ආණ්ඩුව විවේචනය නොකර මානුෂිකව සිතා බලා කටයුතු කරන ලෙසත් පවසන ලදී. එමෙන්ම රාජ්‍ය ආදායම සම්පූර්ණයෙන්ම කඩා වැටී ඇති බැවින් විදේශ විනිමය ලංකාව තුළ නොමැති බව ද යහ පාලන ආණ්ඩුව අවුරුදු 05 ක් තිස්සේ රජය ක්‍රියාත්මක කළ හැටි මතක් කිරීමට කැමති අතර එම කාලය තුළ මෙම සභාව වෙත රුපියල් ලක්ෂ 10 ක වත් ප්‍රතිපාදන ගෙන්වා ගැනීමට නොහැකි වූ බවද කොතරම් වසංගතයක් පැවතියද රටේ සෑම තැනම මේ වන විට ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බවද ගරු සභාපතිතුමා පැවසූ නතර කරන ලද ව්‍යාපෘති තුන ගරු පාර්ලිමේනතු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා හා එක්ව නැවත ලබා ගන්නා බවද අද දින සිදු කළ මෙම විරෝධතාවය නින්දිතව හෙළා දකින බවද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් එදා ආණ්ඩුව ඇවිත් වැට් බදු වැඩි කරන කොට මහජනතාව පාරට බැස්ස අතර දුරකථන සිම් කාඩ් එකට පවා බදු අය කළ

බවද අද වන විට එම බදු ඉවත් කර ඇති බව ද පැවසූ අතර, අද වන විට ඇවිදින මංතීරුව සකස් කිරීමට මුදල් වෙන්කර ඇති බව ද පවසන ලදී.

අනතුරුව සභාව තුළ මන්ත්‍රීවරුන්ගේ කෑ කෝ ගැසීමක් ඇති විය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් තමන්ට මේ සඳහා පිළිතුරු ලබා දිය හැකි නමුත් එයට මෙය අවස්ථාව නොවන බවත් අද දින සභාව අවම කාලයක් තළ අවසන් කළ යුතු බවත් පවසන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- බළන්ගොඩ දෙහිගස්තලාවේ ජෙයිලානි ජාතික පාලසට පිවිසෙන මාර්ගය ආරම්භ කරන ස්ථානයේ ජලය බැස යාමට කාණු පද්ධතියක් නොමැති නිසා වැසි ජලය හා නිවෙස් වලින් පිටවන අප ජලය මාර්ගයේ ගලා යාම නිසා මහජනතාව දැඩි අපහසුතාවට පත්වී ඇති බැවින් ඒ සඳහා විසඳුමක් ලබා දෙන ලෙස 385, දෙහිගස්තලාව, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි ඒ.එම්.එම්.සාදික් මහතා ඇතුලු ප්‍රදේශවාසීන් විසින් ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් තමන් හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා එම ස්ථානයට ගිය අතර එම ස්ථානයේ කාණු පද්ධතියක් නොමැති නිසා ජනතාව දැඩි අපහසුතාවයට පත්ව ඇති බවද මෙය මාර්ග සංවර්ධන අධිකාරිය සතු කාර්යයක් බැවින් සභාව හරහා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙසද පවසන ලදී.

- අංක 476, ඕලුගංතොට, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි ජේ.ඩබ්.ජගත් ප්‍රියංකර යන අය විසින් තම නිවසේ වැසිකිළි වල, ළඟ ළගම අවස්ථා තුනකදී ගලි බවුසරය යොදා ඉසින ලද නමුත් නැවතත් එම වැසිකිළි වල පිරී ඇති බවත් තමන්ට පාසල් යන වයසේ දියවැඩියා රෝගයෙන් පෙලෙන කුඩා දියණියක ද සිටින බැවින් නැවත වරක් වැසිකිළි වල ඉසීම සඳහා සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් මීට ඉහතදී ගලි බවුසර් සේවාවන් ලබා ගත් බවට රිසිට් පත් අමුණා ඇති බැවින් මේ සඳහා 50% ක හෝ සහනයක් ලබා දීම සුදුසු බව පවසන ලදී.

  ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ පරීක්ෂා කර බලා තීරණයක් ගැනීම සුදුසු බවයි.

- පොදු වෙළෙඳසැලේ අංක 16 දරණ ගව මස් කඩ කාමරය ටෙන්ඩර්කරු වන අංක 30/5, රන්දොල කිරිමැටිතැන්න,බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි එම්.එම්.නජීම් යන අය විසින් 2021-05-14 වන දින සිට වෙළෙඳසැල වසා තිබූ බව ද ඉඳහිට එම කඩ කාමරය විවෘත කරන ලද බවද එම කාලය තුළ පාරිභෝගිකයින්ගේ පැමිණීම අවම බව ද පවසා එම කාලය පිළිබඳ අවධානය යොමු කර කුලිය අඩු කර දීමට කටයුතු කරන ලෙස ඉල්ලා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ සියලුම කඩ සම්බන්ධව ඉල්ලීම් පැමිණිය හැකි බැවින් ඉදිරි සභාවක දී තීරණයක් ගැනීම සුදුසු බවයි.

- ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා හට කොවිඩ් 19 වෛරසය ආසාදනය වීම නිසා නිරෝධායන මධ්‍යස්ථානයක සිටින බැවින් එතුමාගේ නිවාඩු අනුමත කරන බව පවසන ලදී.

**04. කල් දී ඇති යෝජනා**

**04:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

05:01:01 කාර්යාලීය අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|
| CR I | 10 |
| CR II | 10 |
| සැනිටයිසර් | ලීටර් 30 |
| කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන පොත් | 50 |
| අතිකාල දීමනා පත්‍රිකා | 1000 |
| මිනි සබන් | 300 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:02 67 -3301 ජල බවුසරය අලුත්වැඩියාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:03 RW 5784 ට්‍රේලරය අලුත්වැඩියාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:04 GK 6227 ට්‍රැක්ටර් රථයේ එන්ජිම සහ ක්ලච් පද්ධතිය පරීක්ෂා කර අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04෴01෴05 කෝබ්රා ලයිට් සඳහා අවශ්‍ය අල්ලු හා GI පෝල් 35 සැකසීම සඳහා පී. එම්. කේ. හාඩ්වෙයාර් වෙතින් ලැබී ඇති අවම මිල වන රු. 7,700.00 ක මුදල (ඒකක මිල) සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04෴01෴06 සෙලින්කෝ රක්ෂණ සමාගමෙහි වෙළඳ ප්‍රවර්ධන කටයුතු සිදු කරගෙන යාම සඳහා 19'×12' ප්‍රමාණයෙන් යුතු ඩිජිටල් දැන්වීම් පුවරුවක් බළන්ගොඩ මර්කන්ටයිල් පුද්ගලික ආයතනය අසල ඇති පෞද්ගලික කුඹුරු ඉඩමක ඉදිකිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ඉල්ලා ඇති අතර, නියමිත භූමියෙහි අයිතිකරුගේ එකඟතාවය හා මාර්ග සංවර්ධන අධිකාරියෙහි අවසර ලබා ගැනීමෙන් අනතුරුව ගිවිසුමකට යටත්ව දැන්වීම් පුවරුව ඉදි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමන් පවසා සිටියේ මේ සඳහා සභාවෙන් මුදලක් වැය නොවන අතර සභාව සඳහා ප්‍රදර්ශන ගාස්තු අයකිරීමෙන් ආදායමක් ලැබෙන බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04෴01෴07 පොදු වෙළඳසැල කඩ අංක 17 දරණ කුකුළු මස් කඩ කාමරය සහ අංක 03 දරණ එළවළු කඩ කාමරය සඳහා ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කිරීමට පවතින සංචරණ සීමා හේතුවෙන් නොහැකි වූ බැවින් සංචරණ සීමා ඉවත් වූ පසු පුවත්පත් දැන්වීම් පළ කර අදාල ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කිරීමට අදාල කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙසේ ටෙන්ඩර් නිකුත් කර ලබා දෙන තුරු දෛනික කුලියක් අය කර මෙම කඩ කාමර ලබා දීම සුදුසු බවට ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් බස්නැවතුම්පල බුදු පිළිමය අසළ කුකුල් මස් කඩ කාමරය මේ වන විටත් විවෘත කර ඇති අතර ඒ සඳහා සභාව මඟින් පියවරක් ගන්නා ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:08 කාර්යසාධන ණය පියවීම සඳහා වැඩිපුර අය වී ඇති වාරික දෙකක මුදල් වන රු. 10,524.00 ක මුදල නැවත එල්. ඩී. එස්. එස්.ජයසේකර මහතා වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:09 බස් නැවතුම්පළ කඩ කාමරවල බදු අයිතිය සංශෝධනය කිරීම - පළාත් පාලන කොමසාරිස්ගේ 03/2020 චක්‍රලේඛය යටතේ අනුමැතිය ලබා ගැනීම

- සී 09 කඩ කාමරය - අශෝකා කුමුදුනී යන අය විසින් අතුකෝරළගේ රදිකා සංජීවනී යන අයට පැවරීම
- සී 18 කඩ කාමරය - මොහොමඩ් ජමීල් මොහොමඩ් ෆවුස් යන අය විසින් මොහොමඩ් තාහිර් නුරුස්සකි යන අයට පැවරීම
- සී 31 කඩ කාමරය - සුනිල් අමරවංශ වෙරළුපිටිය යන අය විසින් ගඟ බඩ ආරච්චිගේ සම්පත් මංජුල බණ්ඩාර යන අයට පැවරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:10 තුරු උයන කලාපය සඳහා වැසිකිළි පද්ධතියක් ඉදි කිරීම හා බළන්ගොඩ නගර සභාවට අයත් පොදු වෙළඳසැල අලුත්වැඩියා කිරීම යන ව්‍යාපෘති සඳහා සබරගමුව පළාත් ලේකම්ගේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණයට යටත්ව ප්‍රසම්පාදනය කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම

04:01:11 ළමා උද්‍යානය අසල ඇති පොදු වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා වූ කර්මාන්තය රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2012, ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමය අනුගමනය කරමින් ප්‍රජාපාදක සංවිධානයකට ලබා දීමට අනුමැතිය ලබා ගැනීම

05:01:10 හා 05:01:11 යන යෝජනා නතර කළ ව්‍යාපෘති සඳහා වන යෝජනා බැවින් එම යෝජනා අනුමත වූ පසු මෙම යෝජනා දෙක අනුමත කිරීම සුදුසු බව සභාවේ මතය වූ බැවින් ඉහත යෝජනා සභා සම්මත නොවීය.

04:01:12 ෆෝටෝන් ජේසීබී යන්ත්‍රයෙහි පිටුපසට ටයර් දෙකක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ගරු සභාපතිතුමා අසනීප වීම නිසා ගරු උප සභාපතිතුමාට මූලාසනය භාරදී පෙ.ව.11.00ට පමණ ගරු සභාපතිතුමන් ගරු සභාවෙන් පිටව යන ලදී.

04ඃ01ඃ13 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

- බෝම්බුව පෙර පාසල සඳහා තීන්ත මිලදී ගැනීම වෙනුවෙන් රු.29,340.00 මුදල ද ජෙන්ට් හවුස් ආයතනය වෙත ගෙවීම.
- ආර්ථික සංවර්ධන නිලධාරී කාර්යාලය අලුත්වැඩියාව සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් රු.11,340.00 ක මුදලක් සෙවන ග්ලාස් හවුස් ආයතනයට ගෙවීම.
- ලේඛනාගාරයේ සැලසුම් අංශය හා කාර්යාල ගබඩා අවශ්‍යතා ලිපිගොනු සංරක්ෂණය සඳහා බයින්ඩින් ටේප් මිලදී ගැනීම වෙනුවෙන් ජෝති ස්ටෝර්ස් ආයතනය වෙත රු.17,000.00 ක මුදලක් ගෙවීම.
- බැංකියවත්ත වහල තීන්ත ආලේප කිරීමට ද්‍රව්‍ය මිල දී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ. හාඩ්වෙයාර් ආයතනය වෙත රු. 18,250.00 ක මුදලක් ගෙවීම.
- කාර්යාල ගබඩා අවශ්‍යතා සඳහා A4 මිලදී ගැනීම වෙනුවෙන් ජෝති ස්ටෝර්ස් ආයතනය වෙත රු.68,500.00 ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
- බැංකියවත්ත, කර්මාන්ත අංශය සඳහා ග්ලවුස් ජෝඩු 47 ක් හා බූට්ස් ජෝඩු 17 ක් මිලදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ. හාඩ්වෙයාර් ආයතනය වෙත රු.52,975.00 ක මුදලක් ගෙවීම.
- 227- 5020 ගලි බවුසරය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ආයතනය වෙත රු. 31,970.00 ක මිල ගණන ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම
- පවත්නා කොවඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් විෂබීජහරණ කටයුතු සිදු කිරීම සඳහා තෙල් ඉසින යන්ත්‍රයක් මිළදී ගැනීම වෙනුවෙන් කැළණි ඒජන්සීස් ආයතනය වෙත රු.24,500.00 ක මුදලක් ගෙවීම.
- ND-5124 වෑන් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඉන්ජිනියරින් ඇන්ඩ් ඔටෝ සර්විස් ආයතනය වෙත රු.13,340.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
- ඇවිදින මංතීරුව විවෘත කිරීමේ උත්සවය සඳහා හට්, පුටු කුලියට ගැනීම වෙනුවෙන් නිපුන කේටරින් සර්විස් ආයතනය වෙත රු.13,000.00 ක මුදලක් ගෙවීම.
- PF-4006 කෘෘ කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඔටෝ සර්විස් ආයතනය වෙත රු.14,975.00 ක මුදලක් ගෙවීම.
- ඇවිදින මංතීරු සමාරම්භක උත්සවය සඳහා ආලෝකකරණයට අවශ්‍ය ෆ්ලැසර් මිලදී ගැනීම සඳහා රු.20,790.00 ක මුදලක් ගෙවීම.

ඉහත යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:14 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 2021-06-01 | ලංකා ක්‍රෂර් කම්පැණි පුද්ගලික සමාගම මගින් විෂබීජහරණය සඳහා එතනෝල් ලීටර 50ක් මිලදී ගැනීම | 02 | 059247 | 25,000.00 |
| 2021-04-22 | ලංකා විදුලි බල මණ්ඩලය - 2021 අප්‍රේල් මස පොදු වෙළඳසැල, මහජන පොළ මුර කුටිය, වැසිකිලිය(පොළ), දොරවෙල ගබඩාව, ආපනශාලාව | 102 | 059149 | 10,498.50 |
| 2021-04-23 | ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් ප්‍රයිවට් ලිමිටඩ් - 2021 මාර්තු මස ඩයලොග් ක්ලවුඩ් බිල ගෙවීම | 103 | 059150 | 11,430.00 |
| 2021-04-23 | ලංකා විදුලි බල මණ්ඩලය - 2021 අප්‍රේල් කාර්යාලය, නගර සභා යාබද ගොඩනැගිල්ල, හෝරා ස්ථම්බය | 105 | 059151 | 35,079.60 |
| 2021-04-27 | ලංකා විදුලි බල මණ්ඩලය -2021-03-16 හා 2021-04-08 වෙරළුප විදුලි බල මණ්ඩලයේ අබලි ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා | 109 | 059153 | 14,453.00 |
| 2021-04-27 | අනඳමෙත් ජ්‍යෙෂ්ට පුරවැසි සංගමය - මහමෙව්නා මාර්ගයේ සෝදා පාලුවන ස්ථාන සඳහා රැදවුම් පැති බැම්ම ඉදි කර නඩත්තු කාලය අවසන් බැවින් කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැන්පත් හා 10% රැදවුම් ගෙවීම | 111 | 059155 | 147,104.11 |
| 2021-04-28 | පී. එම්. පාලිත - ඕලුගංතොට, කරදියමුල්ල පාරේ කොට්ට ගස ඉවත් කිරීම සඳහා ගෙවීම | 112 | 059156 | 30,000.00 |
| | ප්‍රතිභා ජ්‍යෙෂ්ට පුරවැසි සංගමය - සුදර්ශනපුර ප්‍රජා ශාලාවේ වැසිකිළි ඉදි කිරීමේ ව්‍යාපෘතිය අවසන් කර නඩත්තු කාලය අවසන් බැවින් 10% රැඳවුම් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැම්පත් මුදල් ගෙවීම. | 115 | 059159 | 24,750.00 |
| 2021-05-01 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-04-12 සිට 2021-04-30 දක්වා කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම | 01 | 059160 | 40,539.66 |
| 2021-05-03 | පෝස්ට් මාස්ටර් ජනරාල් - තැපැල් මුද්‍රා යන්ත්‍ර මුද්දර මුදල් ගෙවීම. | 02 | 059161 | 10,000.00 |
| 2021-05-05 | ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් | 10 | 059166 | 16157.37 |
| | බළන්ගොඩ ඉලෙක්ට්‍රිකල්ස් - විවිධ කාර්යයන් සඳහා විදුලි උපාංග මිළදී ගැනීම | 15 | 059180 | 22,722.00 |
| | සීගිරි ප්‍රින්ටර්ස් - කාර්යාලයේ විවිධ මුද්‍රණ අවශ්‍යතා සඳහා | 33 | 059188 | 13,950.00 |
| | ඊ.එම්.ජී.කරුණාරත්න ඕෆ්සෙට් මුද්‍රණාලය - මුද්‍රා සැකසීම හා ලිපි ශීර්ෂ මුද්‍රණය කිරීම. | 42 | 059197 | 12,275.00 |
| 2021-05-07 | දෛනික වැටුප් | 48-1 | 059201 | 27,746.06 |
| | දෛනික වැටුප් | 48-2 | 059201 | 93,805.20 |
| | දෛනික වැටුප් - කසළ තේරීම හා පොහොර හැලීම | 48-3 | 059201 | 46,575.00 |
| | දෛනික වැටුප් - පොලිතීන් තේරීම | 48-4 | 059202 | 54,000.00 |
| | දෛනික වැටුප් - සම්පත් පියස | 48-9 | 059501 | 16,400.00 |
| | දෛනික වැටුප් | 48-11 | 059205 | 27,800.00 |
| 2021-05-14 | එස්.ආර්.සඳුන් අමරවර්ධන - 6x12 ස්ටිකර් මුද්‍රණය කිරීම | 65 | 059225 | 25,000.00 |
| 2021-05-17 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-05-01 සිට 2021-05-15 දක්වා නගරයේ කසළ ඉවත් කිරීම | 68 | 059228 | 320,050.00 |
| 2021-06-01 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-05-16 සිට 2021-05-31 දක්වා නගරයේ කසළ ඉවත් කිරීම | 01 | 059245 | 288,025.01 |
| 2021-06-08 | ලංකා විදුලි බල මණ්ඩලය - නව බස්නැවතුම්පල මාර්තු මස විදුලි බිල ගෙවීම | 03 | 059248 | 25,419.40 |
| | ලංකා විදුලි බල මණ්ඩලය - නව බස්නැවතුම්පල අප්‍රේල් මස විදුලි බිල ගෙවීම | 04 | 059248 | 27,603.00 |

| | | | | |
|---|---|---|---|---|
| | ලංකා විදුලි බල මණ්ඩලය - 2021 මැයි මස කාර්යාලයට හා නගර සභා යාබද ගොඩනැගිල්ල විදුලි බිල ගෙවීම. | 10 | 059250 | 31,634.55 |
| | ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් ප්‍රයිවට් ලිමිටඩ් - 2021 මැයි මස කාර්යාලය හා කාර්යාලය ක්ලවුඩ් බිල ගෙවීම | 12 | 059277 | 19,922.00 |
| 2021-06-16 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-06-01 සිට 2021-06-15 දක්වා නගරයේ කසළ ඉවත් කිරීම | 36 | 059298 | 309,382.00 |

ඉහත යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:15 2021 ජුනි මස කර්මාන්ත අංශය මගින් සිදු කිරීමට අපේක්ෂිත නඩත්තු

- දෙවට පාර තාර දැමීම
- මැද කිරිදිගල පළවන පටුමග තාර දැමීම
- බෝම්බුව අමුණ පාර තාර දැමීම

ඉහත යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් අලුත් කර්මාන්ත ඉටු කිරීමට පෙර කලින් කර්මාන්ත කමිටුවේදී අනුමත වූ යෝජනා ඉටු කර සිටින ලෙස ද වැව්වත්ත කාණුවක් සකස් කිරීම සඳහා කර්මාන්ත කමිටුවේදී අනුමත වූ නමුත් එයට ඇස්තමේන්තුවක් හෝ අවශ්‍ය ද්‍රව්‍යයවත් නොමැති බව ද පවසන ලදී.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් කර්මාන්ත කමිටුවට යෝජනා ඉදිරිපත් කළද එයින් මාසයකට ඉටු කිරීමට හැකි වන්නේ කර්මාන්ත තුනක් හෝ හතරක් පමණක් වන බැවින් කර්මාන්ත කමිටුව විසින් නව යෝජනා ගැනීම නතර කර, කලින් ලබා ගත් යෝජනා අවසන් කළ යුතු බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:16 2021 ජුනි මස කර්මාන්ත අංශයේ නඩත්තු සඳහා ද්‍රව්‍ය වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

| ද්‍රව්‍ය | අවශ්‍ය ප්‍රමාණය | ඒකකයක මිල රු. | සම්පූර්ණ මිල රු. |
|---|---|---|---|
| 1 1 /2 ගල් කියුබ් | 05 | 6800.00 | 34000.00 |
| චිප් ගල් කියුබ් | 05 | 6500.00 | 32500.00 |
| 3/4 ගල් කියුබ් | 06 | 6900.00 | 41,400.00 |
| ABC කියුබ් | 07 | 6850.00 | 47,950.00 |

| | | | |
|---|---|---|---|
| වැලි කියුබ් | 05 | 10900.00 | 54,500.00 |
| තාර බැරල් | 30 | 15990.00 | 479,700.00 |
| **එකතුව** | | | **690,050.00** |

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:17 2021-05-06 දින සිට 2021-07-13 දක්වා සෞඛ්‍ය සේවා සඳහා වියදම් වන රු. 2,895,726.00 ක මුදල සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:18 HF 7899 JCB යන්ත්‍රයේ පහත සඳහන් අලුත්වැඩියාවන් ඉටු කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- එන්ජිම ක්‍රියා විරහිත වී ඇති බැවින් එය පරීක්ෂා කර බලා සාදා දීම.
- බ්‍රේක් ඔයිල් දමන ටැංකිය කැඩී ඇති බැවින් එය අලුතින් දැමීම.
- එක්ස්ට්‍රා ඩිප් එක පාත් වන බැවින් ජැක් සීල් දැමීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:19 227-5020 ගලි බවුසරයේ පිටුපස හෙල්පර් අල්ලු දෙක ගලවා වැසිය කැඩුණු කොටස් පාස්සා ඇතුළතට කැලි දෙකක් දමා පාස්සා හෙල්පර් අල්ලු දෙකට අලුතින් ඇණ දමා සවි කිරීම සඳහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.38,000.00 ක මිළ ගණන අනුමත කර එම ආයතනයෙන් අදාළ සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:20 RD 2600 ට්‍රැක්ටරයේ පහත සඳහන් අලුත්වැඩියාවන් ඉටු කර ගැනීම සඳහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.39,700.0 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ඉටු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- වෝටර්ෆෑන් එක අලුතින් දැමීම සඳහා - රු.28,350.00
- රේඩියේටර් ෆෑන් එක අලුතින් දැමීම - රු.4,850.00
- ෆෑන් බෙල්ට් එක අලුතින් දැමීම - රු.3,300.00
- ගලවා සවි කිරීම සඳහා - රු.3,200.00

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:21 RD 8240 ට්‍රැක්ටරයේ බ්‍රේක්පෑඩ් 4 දැමීම සඳහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.21,100.00 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ඉටු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- බ්‍රේක් පෑඩ් හතර සඳහා - රු.17,700.00
- ගලවා සවි කිරීම සඳහා - රු.3,400.00

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:22 37-7933 ට්‍රැක්ටරයේ පහත සඳහන් අලුත්වැඩියාවන් ඉටු කිරීම සඳහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.34,800.00 ක මිළ ගණන අනුමත කර අදාල ආයතනයෙන් එම සේවාව ඉටු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- බ්‍රේක් පෑඩ් 02 සඳහා - රු.18,700.00
- බ්‍රේක් ලයිනර් 04 සඳහා - රු.12,700.00
- වැඩ කුලිය සඳහා - රු.3,400.00

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:23 බොබ්කැට් යන්ත්‍රයේ පූර්ණ සේවා කිරීම සඳහා නියෝජිත ආයතනය වන C-com Equipment Pvt Ltd ආයතනයෙන් ඉදිරිපත් කර ඇති රු.36,655.20 ක මිළ ගණන පහත සඳහන් පරිදි අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ඉටු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| Description | Unit | Qty | Unit Price | Total (Rs) |
|---|---|---|---|---|
| Engine oil filter | No | 01 | 3550.00 | 3550.00 |
| Fuel filter | No | 01 | 4840.00 | 4840.00 |
| Engine Oil | Ltrs | 10 | 710.00 | 7100.00 |
| Grease | Kg | 1 | 850.00 | 850.00 |
| Hydrolic oil | Ltrs | 04 | 425.00 | 1700.00 |
| Battery Water Bottle | No | 01 | 100.00 | 100.00 |

**Technical Charges & Other**

| | |
|---|---|
| Technical charges for the service | 6300.00 |
| Transport charges | 9500.00 |
| VAT 8% | 2715.20 |
| Total Amount | 36655.20 |

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:24 ආයුර්වේදය සඳහා අවශ්‍ය ප්‍රෙෂර් මීටරයක් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ඊ.ජී.එල්.ප්‍රනාන්දු ආයතනයේ රු.26,200.00 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:25 ගබඩා අවශ්‍යතා ලෙස අවශ්‍ය පහත සඳහන් ටෝනර් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුමත කිරීම.

| වර්ගය | ප්‍රමාණය | ඒකක මිළ |
|---|---|---|

| | | |
|---|---|---|
| 285 A Toner | 5 | 3,750.00 |
| 255A Toner | 5 | 9,500.00 |
| LQ 300 Ribbon | 5 | 860.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04ඃ01ඃ26 2021 ජූලි මස සභාවේ ගරු සභිකරුන්ගේ දීමනාව ලෙස රු.270,000.00 ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04ඃ01ඃ27 2021 ජූනි මස හා ජූලි මස සභාවේ නිළධාරීන්ගේ අතිකාල හා ගමන් වියදම් ගෙවීම සඳහා රු300,000.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඉදිරි සභා වාරයේදී අදාළ නම් සමඟ මුදල ඉදිරිපත් කිරීම සුදුසු බව සභාවේ මතය විය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04ඃ01ඃ28 2021 ජූනි මස ගෙවිය යුතු දේශීය ණය සහ සංවර්ධන අරමුදල මඟින් බස්නැවතුම්පල සහිත වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබා ගත් ණය වාරිකය ලෙස රු.769,680.36 මුදලක් ද, වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් ලබා ගත් ණය වාරිකය ලෙස රු.202,918.84 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04ඃ01ඃ29 2021-06-25 දින සිට 2021 ජූලි මස සභාව පැවත්වෙන දින දක්වා සභාවේ සංග්‍රහ වියදම් ලෙස රු.50,000.00 ක මුදලක් වියදම් දැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් පසුගිය මාසවලදී වැය වූ මුදල ඉදිරි මාසයේදී ඉදිරිපත් කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:30 2021-06-25 දින සිට 2021 ජූලි මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ හදිසි වාහන අලුත්වැඩියා කටයුතු සඳහා රු.200,000.00 මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:31 2021-06-25 දින සිට 2021 ජූලි මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ හදිසි යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කටයුතු සඳහා රු.75,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:32 ZA-9835 අංක දරණ ගලි බවුසරයේ ගලි කම්ප්‍රෙෂරයේ සිට එයාර් ක්ලීනරය දක්වා යට හෝස් රත් වීම නිසා උණු වී යන බැවින් එයට යකඩ බටයක් දමා අලුත්වැඩියා කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:33 227-5020 ගලි බවුසරයේ ජියර් පෙට්ටිය අලුත්වැඩියා කිරීම සහ අඟල් 2 හෝස් වට අඩි 100 ක් හා අඟල් 3 හෝස් අඩි 15ක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:34 සභාව සතු වාහන 2021-07-01 සිට 2021-12-31 දක්වා පූර්ණ සේවා කිරීමට අදාළව රිෂානා සර්විස් ආයතනයෙන් හා කේ.ඒ.ඔටෝ සර්විස් ආයතනයෙන් ලබා දී ඇති මිළ ගණන් අනුව අවම මිළ යටතේ සේවාවන් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:35 සතොස අලෙවිසැල් පරිශ්‍රයන්හි දැන්වීම් තිර සහ දැන්වීම් පුවරු ස්ථාපනය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපතිතුමන් විසින් පවසා සිටියේ මේ සඳහා සභාවට ප්‍රදර්ශන ගාස්තු අය වන බැවින් වාර්ෂික ගිවිසුමක් මඟින් ලබා දීම සුදුසු බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:36 නගර සභාව සතු තුරු උයන කොටස, පිට්ටනිය කොටස හා ළමා උද්‍යාන කොටසෙහි ඉඩම් මැන සැලසුම් සකස් කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:37 රථ වාහන ටෙන්ඩරය සඳහා සහනයක් ලබා දීම පිළිබඳ සභා තීරණයක් ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව සභාවේ සිදු වූ සාකච්ඡාවෙන් අනතුරුව 2021-05-20 දින සිට 2021-06-21 දින දක්වා කොවිඩ් 19 ව්‍යාප්තිය හේතුවෙන් සංචරණ සීමා පනවා තිබූ බැවින් එම කාල වකවානුව සඳහා සියලු සභා දේපල වල කුලිය 100% ක් කපා හැරීම සුදුසු බවට ගරු උප සභාපති ඒ.ටී.එම්.රූමි මැතිතුමා විසින් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගල්ප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04៖01៖38 සභාව සතු දන්වීම් පුවරු 10 ලබා ගත් ටෙන්ඩර්කරු විසින් 2021-05-14 වන දින සිට නැවත නගර සභාව වෙත භාර දීමට කටයුතු කරන බැවින් ඔහුගේ ඇප මුදල් නිදහස් කරන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත. මේ පිළිබඳව සභා තීරණයක් ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙය ටෙන්ඩර් කොන්දේසි උල්ලංඝනය කිරීමක් වන බැවින් නීත්‍යානුකූලව මෙම මුදල නිදහස් කළ නොහැකි බවත්, මෙම ඇප මුදල ආපසු ගෙවීමට නොහැකි බවත් සභාවේ මතය විය.

04៖01៖39 බස් නැවතුම්පල අක්‍රිය වී ඇති විදුලි පහන් යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම.

| | | |
|---|---|---|
| LED (12w) pin type 2 year warranty Bulbs | - | 50 |
| Holder (poli rome) | - | 30 |

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04៖01៖40 බැංකියවත්ත කොම්පෝස්ට් අංගනයේ පොහොර හලන යන්ත්‍රයෙන් හලා ඉවත් කරන කොටස් නැවත භාවිතයට ගැනීම සඳහා ගබඩා කර තැබීමට මඩුවක් ඉදි කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04៖01៖41 බළන්ගොඩ නගර සභාවේ විදුනැණ පියස මඟින් ලබා දෙන විද්‍යුත් ඉගෙනුම් නොමිලේ ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම හා ඒ සඳහා අවශ්‍ය හෙඩ් ෆෝන් 8 ක් ලබා ගැනීම හා පරිගණක තුනක් යාවත්කාලීන කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ විදුනැණ පියස මඟින් මුදල් අය කර සිදු කරන විද්‍යුත් අධ්‍යාපනය එක් දරුවකුට දිනකට පැය දෙක බැගින් නොමිලේ අධ්‍යාපනය ලබා දීම සඳහා අනුමැතිය ඉල්ලා සිටින බවයි.

සභාවේ පුනරාවර්තන වියදම් දැරීමට පෙර පූර්ව අනුමැතිය ලබා ගත යුතු බැවින් හා මෙමගින් සභාවට ආදායමක් අහිමි වන බැවින් මේ සඳහා වන ඇස්තමේන්තුවක් සකස් කර ලබන සභාවට ඉදිරිපත් කරන ලෙසද හෙඩ් ෆෝන් සඳහා හා පරිගණක තුනක් යාවත් කාලීන කිරීම සඳහා වන මිළ ගණන් ලබන සභාව වෙත ඉදිරිපත් කර මේ සඳහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව සභාවේ මතය විය.

04:01:42 226-7521 දරණ ටිපර් රථයේ පහත සඳහන් අලුත්වැඩියාවන් සිදු කිරීම සඳහා නැෂනල් මෝටර්වේස් ආයතනයෙන් ඉදිරිපත් කර ඇති රු.30,250.00 ක මුදල අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- ඉදිරිපස බ්‍රේක් වොෂර්, බ්‍රේක් ඔයිල් ,රබර් ග්‍රීස් සපයා සවි කර පද්ධතිය සැකසීම -රු.5,970.00
- පිටුපස බ්‍රේක් වොෂර්, බ්‍රේක් ඔයිල්, රබර් ග්‍රීස්,හබ් ඔයිල් සීල්ස්, බ්‍රේක් ලයිනර් සෙට් සපයා සවි කර පද්ධතිය සැකසීම - රු.24,280.00

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගර නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:43 ව්‍යාපෘති සඳහා ජල බවුසරය ලබා දීමේදි අය කරන රු.3,000.00 ගාස්තුවට අමතරව රු.1,000.00ක අමතර ගාස්තුවක් අය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගර නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:44 මෝටර් ග්‍රේඩර් ක්‍රියාකරු වශයෙන් කේ. ඒ. චමින්ද ලක්රුවන් බණ්ඩාර යන අය බඳවා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඉහත නම සඳහන් කේ. ඒ. චමින්ද ලක්රුවන් බණ්ඩාර යන අය පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු බඳවා ගැනීමටත් එතෙක් දිස්ත්‍රික් මිළ කමිටුවේ මිළ ගණන් මත සේවය මිලදී ගැනීමටත් චෙක් රෝල් පදනම මත වැටුප් ගෙවීමත් සුදුසු බවට ගරු උප සභාපතිතුමන් විසින් සිදු කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05. මන්ත්‍රී යෝජනා**

**05:01. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

05:01:01 සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ඉදි කිරීමට යෝජිත වැවවත්ත ප්‍රජා ශාලා පරිශ්‍රයේ සවි කර ඇති අබලන් වී තිබෙන ක්‍රීඩා භාණ්ඩවලින් අයිතම 03 ක් ප්‍රතිසංස්කරණය කර වැවවත්ත ළමා සුරකුම් මධ්‍යස්ථානයේ සවි කිරීම

05:01:02 ඉදිරියේ දී ඩෙංගු රෝගය පැතිරයාමේ අවදානමක් ඇති බැවින් සංචරණ සීමා නීති ඉවත් කර නැවත නගරය ජනාකීර්ණ වීමට පෙර නගර පවිත්‍රතා වැඩසටහනක් (Clean city) පැවැත්වීම

05:01:03 නගරයේ එකතුවන අපවිත්‍ර ජලය සහ වැසි ජලය බැහැර ලන ප්‍රධානම කාණුව (මොහාන් සාලිය එල්ලාවල මාවතේ සිට නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමට මායිම හරහා ගොස් දොරවෙල ඔයට ජලය බැහැර කරන කාණුව )පිරිසිදු කිරීම

05:01:04 එපිටපැත්ත අස්වැද්දුම සහ දෙණියකුඹුර මාර්ගවල යෝජිත පානීය ජල ව්‍යාපෘතියේ ජල නල එලීම සඳහා කාණු කැපීමට ජේසීබී යන්ත්‍රය ලබා දීම.

05:01:05 අස්වැද්දුම එපිටපැත්ත මාර්ගයේ හා දෙණියකුඹුර මාර්ගයේ යෝජිත පානීය ජල ව්‍යාපෘති සඳහා මාර්ග උරහිස පළුදු කිරීමේ ගාස්තුවෙන් නිදහස් කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී දඅහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසා සිටියේ වැවවත්ත ප්‍රජා ශාලාවේ අලුතින් සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ඉදිරිකිරීමට නියමිත බැවින් එහි දැනට පවතින ක්‍රීඩා භාණ්ඩ ප්‍රතිසංස්කරණය කර වැවවත්ත දිවා සුරකුම් මධ්‍යස්ථානය වෙත ලබා දීම සුදුසු බවයි. එමෙන්ම මේ දිනවල ඩෙංගු රෝගය හිස ඔසවමින් පවතින බැවින් නගරයේ පවිත්‍රතා වැඩසටහනක් පැවැත්වීම සුදුසු බවද තමන් විසින් ඉදිරිපත් කර ඇති ඉතිරි යෝජනාද කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:02 ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

05:02:01 තම කොට්ඨාශවල බදු ගෙවන ජනතාව වෙනුවෙන් සේවය කිරීමට කැමති මන්ත්‍රීවරුන්ට පමණක් සභා අරමුදලින් මිලියන 1.5 ක යෝජනා ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන ඉල්ලා සිටිමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය පවසා සිටියේ කොට්ඨාශවල ඉටු කිරීමට අවශ්‍ය යෝජනා බොහෝ තිබෙන බැවින් ලක්ෂ 15 යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙසයි.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් පසුගිය සභාවේදී මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කළ නමුත් එතුමා විසින් එය ඉල්ලා අස්කරගත් බවද සභාවේ බහුතරයකින් යෝජනාව සම්මත විය යුතු අතර එසේ නොමැතිව යෝජනා ක්‍රියාත්මක කළ නොහැකි බව ද ගරු අණ්ඩුකාරතුමා හා කොමසාරිස්තුමා ලිඛිතව සභාව සඳහා බලය ලබාදී ඇත්තේ පුනරාවර්තන වියදම් දැරීම සඳහා පමණක් වන බවද අයවැය සම්මත නොවීම නිසා අලුත් ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක කළ නොහැකි බවද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් මහජනතාවගේ ඡන්දයෙන් තේරී පත්ව මෙම ස්ථානයට පැමිණියේ මහජනතාවට සේවය කිරීම සඳහා වන බැවින් සභාවේ මුදල් කෝටි ගණනක් තිබියදී මහජනතාවට සේවය කිරීමට නොහැක්කේ මන්දැයි විමසූ අතර, ජනතාවට සේවය කිරීමට අකමැති කුමන මන්ත්‍රීතුමාද යනුවෙන් විමසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් මෙම යෝජනාව සඳහා බෙදීමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මෙය අයවැය සම්මත නොවූ සභාවක් බැවින් ක්‍රියාත්මක කිරීමට නොහැකි යෝජනා ඉදිරිපත් කිරීමෙන් සභාව අපහසුතාවයට පත්වන බවත්, බෙදීමක් ලබා දීමේ ගැටලුවක් නොමැති බවත් ය.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් 06ඃ02ඃ1 යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉන් අනතුරුව මෙම යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය නොවන බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉන්පසු ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ විවිධ අදහස් පළවීම නිසා සභාවේ ඝෝෂාකාරි තත්ත්වයක් ඇතිවිය.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ 2021 වර්ෂයේ අයවැය සම්මතද නැද්ද යන්න නීතිපති මතය මේ වන තෙක් ලැබී නොමැති බැවින් නීතිපති මතය පැමිණෙන තෙක් මෙම යොජනා ක්‍රියාත්මක කිරීමට නොහැකි බවයි. එමෙන්ම 6ඃ02ඃ01 යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය බවට හා බෙදීමක් අවශ්‍ය නොවන බවට යෝජනා දෙකක් ඉදිරිපත් වී ඇති නිසා මෙම යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍යද නැද්ද යන්න තීරණය කිරීමට ඡන්දයක් විමසීමට සිදු වන බැවින් ඒ සඳහා ඡන්දයක් විමසන ලදී.

එහිදී 06ඃ02ඃ01 යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය බවට ගරු සභිකවරුන් සිව්දෙනෙකුද, එනම්,

| | |
|---|---|
| 01. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රිනී | තරංගනී සමරසේකර මැතිතුමිය ද |

ඒ සඳහා ඡන්දයක් අවශ්‍ය නොවන බවට ගරු සභිකවරුන් නව දෙනෙකුද, එනම්,

| | |
|---|---|
| 01. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 07. ගරු නාගරික මන්ත්‍රිනී | ජී.චන්ද්‍රලතා මැතිතුමිය |

08. ගරු නාගරික මන්ත්‍රිනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය

09. ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය

ඡන්දය ප්‍රකාශ කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි අතර, ගරු සභාපතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලික්ෂා මැතිතුමා සභා ගර්භයේ නොසිටීය. ඒ අනුව 05ඃ02ඃ01 යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය නොවන බවට වැඩි ඡන්ද පහකින් සම්මත විය.

**05ඃ03 ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

05ඃ03ඃ01 සියඹලාගහවත්ත කැඩී යන මාර්ගය පිළිසකර කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ04 ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

05ඃ04ඃ01 උඩකන්ද පාර දෙපස තණකොළ වැවී ඇති කොටස ශුද්ධ කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මාර්ගය හොඳටම අබලන් වී ඇති බවත්, කර්මාන්ත කමිටුවට තමන් විසින් ඉදිරිපත් කළ කිසිඳු යෝජනාවක් මේ වන විට ක්‍රියාත්මක වී නොමැති බවත් පවසන ලදී.

ගරු උප සභාපතිතුමන් පවසා සිටියේ වැඩ අධිකාරී මහතා සමඟ පරීක්ෂා කර කර්මාන්ත කමිටුව හරහා මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ05 ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

05ඃ05ඃ01 ගාලවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

05ඃ05ඃ02 ආනන්ද මෛත්‍රී මාවතේ මංගලිකා ඉලංකෝන් මහත්මියගේ නිවස ඉදිරිපිට බෝක්කුව ශුද්ධ කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් ගාලවත්ත මාර්ගයේ මීටර් 200 ක පමණ කොටසක් ප්‍රතිසංස්කරණය කිරීමට ඇති බවද නවක මන්ත්‍රීතුමියගේ නිවස ඉදිරිපිට බෝක්කුව ශුද්ධ කිරීමට ඇති බැවින් මෙම නඩත්තු දෙක කඩිනමින් ඉටු කරදෙන ලෙස ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05෴06 ගරු නාගරික මන්ත්‍රීඑම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

05෴06෴01 බළන්ගොඩ මිරිස්වත්ත අලාබ්දීන් මාවත නඩත්තු කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05෴07 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

05෴07෴01 ආපන ශාලාව ආපසු භාරදීම

05෴07෴02 යූ.රේණුකා මුණසිංහ යන අයට සිදුවූ ආපදාව සම්බන්ධයෙන් සහනයක් ලබා දීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් 06෴07෴01 යෝජනාව තමන්ට ලැබුණු ලිපියක් බවද පවතින කොවිඩ් 19 හමුවේ 2021 අප්‍රේල් මස සිට ආපන ශාලාව විවෘත නොකර ඇති බැවින් එම මාස වල කඩ කුලිය අයකර නොගන්නා ලෙස ටෙන්ඩර්කරු විසින් ඉල්ලා ඇති බව ද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ අද දින 05෴01෴37 යෝජනාවේදී ලබා ගත් තීරණය පරිදි 2021-05-20- දින සිට 2021-06-21 දින දක්වා ආපන ශාලාවේ ගාස්තු අය කිරීමෙන් නිදහස් කරන බවද ඉතිරි මාසවල කුලිය නිදහස් කිරීම සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා වෙත ලිපියක් ඉදිරිපත් කර තීරණයක් ගැනීම සුදුසු බවද පවසන ලදී.

අනතුරුව 06෴07෴02 යෝජනාව සම්බන්ධයෙන් පැහැදිලි කිරීම සඳහා ගරු උප සභාපතිමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

වැඩ අධිකාරිතුමාගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05෴08 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

05෴08෴01 නගරයේ වෙළෙඳසැල් සඳහා මින් ඉදිරියට බලපත්‍රය ලබා දීමේදී කුඩා ගිණි නිවන උපකරණයක් සවිකර දීම අනිවාර්ය කිරීම.

05෴08෴02 මවිසින් මීට ඉහතදී ඉදිරිපත් කළ යෝජනාවක් අනුව නගරයේ තැනින් තැන ජල කරාම සවිකිරීමට ජල සම්පත් මණ්ඩලයට උපදෙස් දීම.

05෴08෴03 රත්නපුර දිස්ත්‍රික් කමිටු සභාපති ගරු අකිල එල්ලාවල මැතිතුමාගේ නිවෙස් පාර කොලරය පුරවා නඩත්තු කටයුතු සිදු කර දීම.

05ඃ08ඃ04 පේමන්ට් කඩ 31 ට අවශ්‍ය විදුලිය බස් නැවතුම්පලේ ගොඩනැගිල්ලෙන් ලබා දීම සහ ඔවුන්ට අවශ්‍ය අඩුපාඩු සපුරා දීම.

05ඃ08ඃ05 සේනක පෙදෙසේ අඩු ආදායම්ලාභීන් සිටින පවුල් වෙසෙන ස්ථානයේ වැසිකිළි වලවල් ප්‍රශ්නයට විසඳුමක් ලබා දීම.

05ඃ08ඃ06 දෙවට පාර කුඹුර අසළමාර්ගය, බෝම්බුව මාර්ගය දක්වා දෙපස වල්කොටා නඩත්තු කටයුතු කර දීම.

05ඃ08ඃ07 පසුගිය කර්මාන්ත කමිටුවේ ස්තිර වූ යෝජනා සියල්ලම කර අවසන් ද? තාර, ගල් වැලි අවසන්ද? තිබේනම් කොපමණ ද?2021-05-20 දිනෙන් පසුව කර ඇති නඩත්තු කටයුතු?

05ඃ08ඃ08 ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම වැඩසටහනේ කාබනික පොහොර පරිහරණය නිසා නගර සභාවේ කොම්පෝස්ට් පොහොරවලට මීට වැඩිය ප්‍රචාරයක් ලබා දීම සහ විකිණීමට උනන්දු වීම.

ඉහත සඳහන් යෝජනා ගරු උපසභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් වෙළෙඳසැල් සඳහා බලපත්‍රයක් ලබා දීමේදී කුඩා ගිණි නිවන උපකරණයක් සවිකිරීම අනිවාර්ය කරන ලෙසද මීට දින කිහිපයකට ඉහතදී බස්නැවතුම්පල සුදු මල්ලී හෝටලයේ මුලුතැන්ගෙයි ගෑස් ගින්නක් ඇති වී නගර සභාවේ ගිණි නිවන උපකරණ යොදා එම ගින්න මැඩ පැවැත්වූ බවද පවසන ලදී.

එමෙන්ම තමන් විසින් ඉදිරිපත් කර ඇති ඉතිරි යෝජනාද කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ09 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

05ඃ09ඃ01 බෝම්බුව මිරිස්කොටුව පාර ආරම්භයේ කොන්ක්‍රීට් ප්ලේට් එක දැමීම.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**07. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

**08. ඇස්තමේන්තු අනුමත කිරීම**

## 09. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්

**ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් පවතින ආණ්ඩුව සමඟ කටයුතු කරන සභාවේ ගරු මන්ත්‍රීවරුන් හට තම කොට්ඨාශවල සංවර්ධන කටයුතු ඉටු කිරීමේදී තම පක්ෂය අකුල් නොහෙලන බව ද සභාවේ මුදල් විශාල ප්‍රමාණයක් තිබියදී එයින් සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස අද දින ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය යෝජනාවක් ඉදිරිපත් කළ බවද රු.5000.00 දීමනාව ලබා දීමේ දී යම් මුදලක් කපා ඉතිරිය ලබා දුන් බවද ගියවර රු.5000.00 දීමනාව ලබා දීමේදී කොට්ඨාශයේ මන්ත්‍රීවරයාගෙන් විමසීමට ලක් කළ නමුත් මෙවර එය සිදු නොවූ බවද මෙම දීමනාව ලබා දීමේදී එය දේශපාලනීකරණය සිදු නොකර පක්ෂ පාට භේදයකින් තොරව ලබා දිය යුතු බවද සියලු දෙනාගේ බඩගින්න එක සේ සළකා සියලු දෙනාට මෙම දීමනාව ලබා දෙන ලෙසද පවසන ලදී.

බළන්ගොඩ ප්‍රදේශයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් දෙදෙනෙකු සිටින අතර ගරු සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිතුමියද රත්නපුර දිස්ත්‍රික්කයේ සිටින නමුත් බළන්ගොඩ ප්‍රදේශයට අයත් එන්නත් ප්‍රමාණය ලබා ගැනීමට අපොහොසත් වී ඇති බවද මෙය ආණ්ඩුවේ නොහැකියාවද ජනාධිපතිතුමාගේ නොහැකියාවද අගමැතිතුමාගේ නොහැකියාවද කාගේ නොහැකියාවද කියා නොතේරෙන නමුත් දිස්ත්‍රික්කයේ ජනතාවට අවශ්‍ය එන්නත් ලබා දීමට කටයුතු සිදු කරන ලෙස අදාළ අය දැනුවත් කරන ලෙසද පවසන ලදී. එමෙන්ම මේ වන විට රටේ ඉන්ධන මිළ, බඩු මිළ ඉහළ නැග ඇති අතර මෙරටට විශාල අපනයන ආදායමක් ගෙන දෙන තේ ගම්මිරිස් සඳහා අවශ්‍ය පොහොර නොමැති වීම තුලින් අස්වැන්න අඩු වී ඇති බව ද ජනතාවගේ ආදායම් මට්ටම පහළ වැටීමට මෙය හේතු වී ඇති බව ද කාබනික පොහොර ලබා දෙන්නේ නම් එලෙස ලබා දීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර රසායනික පොහොර නතර කළ යුතු බවද රටට විදේශ විනිමය තේ වගාවෙන් ගෙන එන අතර ඔවුන්ගේ බඩට ගැසීම සිදු නොකරන ලෙසද මේ සඳහා පියවරක් ගන්නා ලෙස ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා අදහස් දැක්වීමේදී රු.5000.00 දීමනාව ලබා දුන් අවස්ථාවේදී යම් මුදලක් කපා ඉතිරි ප්‍රමාණය ලබා දුන් බවට පැවසූ නමුත් එලෙස සිදු නොවූ බව ද සමෘද්ධිලාභීන් සඳහා මාසිකව ලබා දෙන රු.3000.00 දීමනාව ලබා දෙන නිසා ඔවුන්ට තවත් රු.2000.00 ක් දුන් බවද එම දීමනාව ලබා දීමේදී පක්ෂ පාට බේදයකින් තොරව සියලු දෙනාට ලබා දුන් අතර රජය විසින් වාර්ෂික අයවැයක් යටතේ කටයුතු කරන බවද එලෙස දීමනාව ලබා දීමේදී කාට හෝ නොලැබී ඇත්නම් අදාළ කොට්ඨාශය භාර නිළධාරීන් ඒ සම්බන්ධව දැනුවත් කරන ලෙසද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් ගියවර රු.5000.00 දීමනාව ලබා දුන් ලෙසම මෙවර ද එම දීමනාව පක්ෂ පාට භේදයකින් තොරව ලබා දෙන බවද රැකියා ලක්ෂයේ ව්‍යාපෘතිය යටතේ රැකියා ලැබුණ පිරිසට හා උපාධිධාරී පත්වීම් ලද පිරිසට එම දීමනාව නොලැබෙන බවද පවසන ලදී. එමෙන්ම මෙම දීමනාව ලබා දීමේදී සමෘද්ධිලාභීන්, වකුගඩු දීමනාව ලබන පුද්ගලයින්, අඩු ආදායම්ලාභීන්, සමෘද්ධිලාභී පොරොත්තු ලේඛනයේ සිටින පුද්ගලයින් සඳහා හා රැකියා අහිමි වූ පුද්ගලයින් සඳහා ප්‍රමුඛතාවය ලබා දුන් බව වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මෙම සභාව පත් වූ කාලය තමාට සිහිවෙන අතර සුහද කොකා පෙන්වමින් සභාපතිධූරය හා සභාවේ බලය ලබා ගත් බවද

නගර සභාවේ කොට්ඨාශ 10න් 07 ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණට ලැබුණු අතර එක්සත් ජාතික පක්ෂයට ආසන 06 ක් හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආසන තුනක් වශයෙන් ලැබුණු බවද මෙහිදී සභාපතිධූරය හිමි විය යුත්තේ ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණට වන නමුත් පැවති විකෘති ඡන්ද ක්‍රමය තුළ එය සිදු නොවූ බවද එහි ප්‍රතිඵලය අද පෙනෙන බව ද පවසන ලදී. එමෙන්ම අයවැය නිසි ලෙස සම්මත නොවී සභාවේ මුදල් සංවර්ධන කටයුතු සඳහා වියදම් කිරීමට නොහැකි බවද සභාවේ කිසිඳු පුනරාවර්ථන වියදමක් කපා නොහැර ඇති අතර තම පක්ෂය විරුද්ධ වන්නේ නම් පුනරාවර්ථන වියදම් හෝ දැරීමට නොහැකි වන බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා සංවර්ධන කටයුතු පමණක් නතර කර ඇති බවත්, කරන්න බැරි දේට වාද විවාද කර තේරුමක් නොමැති අතර බළන්ගොඩ සංවර්ධනයට අවශ්‍ය මුදල් මධ්‍යම ආණ්ඩුවෙන් ලැබී ඇති බවද මෙම ආණ්ඩුව වැට් බද්ද ඉවත් කර ඇති අතර ජනතාව ඒවා තේරුම් නොගන්නා බවද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් අද දිනයට පමණක් සභාවේ කටයුතු සඳහා සිදු කරන සංග්‍රහ වියදම කොපමණද යනුවෙන් විමසූ අතර අද දින මේ සඳහා සභාවේ නිළධාරීන් කී දෙනෙක්ගේ කාලය කැප කරන්නේද යනුවෙන් විමසන ලදී. එමෙන්ම ගරු සභිකවරුන් මෙම සභාවට පැමිණියේ මහජනතාවට සේවය කිරීම සඳහා වන අතර එය කිරීමට අවස්ථාව ලබා නොදෙන බවද සංවර්ධන යෝජනා ඉටු කිරීම සඳහා සභාවෙන් අනුමැතිය ලබා ගෙන ආණ්ඩුකාරතුමා වෙත එම තීරණය යැවිය හැකි නමුත් සියලු දෙනාට එක් තීරණයකට පැමිණිය නොහැක්කේ මන්දැයි විමසන ලදී. එමෙන්ම රු.5000.00 දීමනාව ලබා දීම සිදු කරනුයේ අයවැයක් මඟින් වන බව ගරු මන්ත්‍රීවරියක් පැවසූ අතර එසේනම් අවිනිශ්චිත ගිණුමක් පවතින්නේ මන්දැයි විමසන ලදී

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා සභාපති ධූරයේ සිටින සමයේදී පුවක්ගමුල්ල මාර්ගයේ කාපට් ව්‍යාපෘතිය ආරම්භ කළ අතර එතුමාට ස්තුතිවන්ත වන බවද ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය තම පක්ෂයේ මන්ත්‍රීවරුන් ජනතා ද්‍රෝහීන් සේ සිතා කතා කළ බවද ආණ්ඩුකාරතුමා මුදල් වියදම් කිරීමට නොහැකි බව පවසන්නේ නම් මුදල් වියදම් කළ නොහැකි අතර පවත්නා නීතිමය තත්ත්වය තේරුම් ගන්නා ලෙසද පවසන ලදී.

එමෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ ග්‍රාම නිළධාරී වසම් 576 ක් පවතින අතර ජූනි මස 06 වන දින වන විට බළන්ගොඩට වඩා අවදානම් ප්‍රදේශ ලෙස තිබූ වෙනත් ප්‍රදේශ සඳහා එන්නත් කිරීමේ කටයුතු සිදු කළ බවද අවදානම් වැඩි ප්‍රදේශ සඳහා එන්නත් කිරීමේ කටයුතු කඩිනමින් සිදු කරන බවද පවසන ලදී.

මීට අමතරව ඉන්ධන මිළ ඉහළ දැමීම අසාධාරණ බව පැවසුවද මෙම කාලය තුළ අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනතාධිපතිතුමා නොසිටියේනම් රටේ තත්ත්වය බලා ගැනීමට හැකිව තිබූ බවද යහපාලන ආණ්ඩුව පැවති සමයේදී රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම අවුරුදු 05ටම එක්වරක් පමණක් පැවති නමුත් මේ වන විට මාසිකව රැස්වීම් දෙකක් පමණ පැවැත්වෙන බවද පවසන ලදී.

එමෙන්ම රජය කොවිඩ් 19 වසංගතය මැඩලීම සඳහා විශාල මුදලක් වැය කරමින් සිටින බව ද පුද්ගලිකව පීසීආර් පරීක්ෂණයක් සිදු කිරීමට රු.6800.00 ක් වැනි මුදලක් වියදම් වන අතර රජය මඟින් එය නොමිලේ සිදු කරන බවද මේවන විට ලක්ෂ 26 කට ආසන්න ප්‍රමාණයකට එන්නත් කිරීමේ කටයුතු සිදු කර ඇති අතර නිරෝධායනයට ලක්ව සිටින පවුල් එකක් සඳහා රු.5000.00 බඩු මලු දෙකක් ලබා දෙන බවද පවසන ලදී. එමෙන්ම ලක්ෂ 15 කට අධික රාජ්‍ය සේවකයින් පිරිසක් නිවසේ සිට වැටුප් ලබන අතර මෙවැනි පොඩි දෙයක් මුල්කරගනිමින් දේශපාලනය සිදු නොකරන ලෙසද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් තමන් නියෝජනය කරන ඇල්ලෙපොල කොට්ඨාශයේ ජනතාව හා ග්‍රාම නිළධාරී සමග තමන් සාකච්ඡා කළ අතර එහිදී එම කොට්ඨාශයට ඉටු විය යුතු කාර්යයන් රැසක් ඇති බව හඳුනා ගනු ලැබූ බවද ඒ අතරින් ඇල්ලෙපොල ගවරන්හේන හන්දිය සඳහා බස් නැවතුම්පලක් අවශ්‍යව ඇති බවද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් මෙම සභාවේදී තම කොට්ඨාශයේ ජනතාව වෙනුවෙන් කථා කළ යුතු අතර රු.5000.00 දීමනාව ලබා දීමේදී දේශපාලනිකව ලබා දුන්නා යැයි කීම වැරදි සහගත බව ද ඕලුගංතොට ප්‍රදේශයේ රු.5000.00 දීමනාව ලබා දිය යුතු සියලු දෙනාටම එම දීමනාව ලබා දුන් බවද තමන් දේශපාලනය මනුස්සත්වයෙන් සිදු කරනු ලබන අතර එසේ ඕලුගංතොට ප්‍රදේශයේ මෙම දීමනාව ලබා නොදුන් පුද්ගලයෙක් කිවහොත් තමන් මන්ත්‍රීධූරයෙන් ඉල්ලා අස්වන බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් සභාව වෙත පැමිණි ලක්ෂ 180කට ආසන්න ව්‍යාපෘති නතර වීම පිළිබඳ තම කණගාටුව පළ කරන ලද අතර බළන්ගොඩ ප්‍රදේශයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු සිටින බවද විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන නොමැති අතර බළන්ගොඩ ජනතාවට සේවය කිරීම සඳහා මෙම ව්‍යාපෘති තුන නැවත ලබා ගත යුතු බව ද පවසන ලදී.

එමෙන්ම බළන්ගොඩ පොදු වෙළෙඳසැල අලුත්වැඩියා නොකරන බවට සභාවේදී කෑ ගසා සිටි නමුත් ප්‍රතිපාදන ලැබුණු අවස්ථාවේදී එය ආපසු යැවීම අපරාධයක් වන අතර ඒ පිළිබඳව කණගාටුවන බවත්, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා සමඟ සාකච්ඡා කර හෝ මෙම ප්‍රතිපාදන නැවත ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් පවසන ලදී.

එමෙන්ම පඹහින්න රෝහල වසා දමා මාස 05 ක පමණ කාලයක් ගතව ඇති අතර ගරු සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිතුමිය කිහිපවරක් බළන්ගොඩට පැමිණියද මේ ගැන සොයා බලා කටයුතු කර නොමැති බව ද මේ පිළිබඳව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා සමඟ සාකච්ඡා කර යම් ක්‍රමවේදයක් සකස් කරන ලෙසද කොවිඩ් 19 වසංගතය පවතින අවස්ථාවේදී මෙම රෝහල් වැසීයාම අපරාධයක් බවද පවසසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය පැවසුවේ වසංගතයක් පවතින අවස්ථාවක ඉන්ධන මිළ ඉහළ දැමීම ජනතාවට දරාගත නොහැකි බවයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ 56% ක් දුප්පත් ජනතාව සිටින අතර බළන්ගොඩ ජනතාව පමණක් නොව ලංකාවේම ජනතාව බඩගින්නේ සිටින බව ද ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කර ලක්ෂ 15 සංවර්ධන යෝජනා සභාව සඳහා ලබා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙසද පවසන ලදී.

ගරු මන්ත්‍රීවරුන් සභාපති සිහිනය සැබෑ කර ගැනීමට කටයුතු සිදු නොකරන ලෙසද තව මාස 5ක් - 6ක් පමණක් සභාව පවතින අතර ප්‍රතිපාදන සභාව වෙත ඒම නතර නොකරන ලෙසද ඉන්න හිතෙන රටේ ජනතාව කන්න නැතිව සිටින බවද පවසන ලදී.

එමෙන්ම කොවිඩ් 19 වෛරසය ආසාදිතව සිටින ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා නිරෝධායන මධ්‍යස්ථානය වෙත රැගෙන යාම සඳහා උදේ 9 ට පමණ බළන්ගොඩ ක්‍රීඩාංගණයට ගෙනවිත් ඇති නමුත් එදින සවස 5 වන තුරු එහි රැඳී සිටීමට සිදු වී ඇති බවත් පවසමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් රජය විසින් ඉන්ධන මිළ ඉහළ දැමීමට විරුද්ධව අද දින කලු පටි පැළඳ සභාව වෙත පැමණ නිහඬ විරෝධතාවයක යෙදුණු අතර ඒ සඳහා සහයෝගය ලබාදුන් අය සඳහා ස්තුතිය පළ කරන ලදී. පොහොර අවශ්‍ය වන්නේ කුඹුරුවලට

පමණක් නොවන අතර අනෙකුත් වගාවන් සඳහාද පොහොර අවශ්‍ය වන බවද අද වන විට අධ්‍යාපන ක්ෂේත්‍රය කඩාකප්පල් වී ඇති අතර ඔන්ලයින් අධ්‍යාපනය සඳහා අවශ්‍ය අන්තර්ජාල පහසුකම් නොමැතිව දරුවන් අපහසුතාවයට ලක්ව ඇති බවද පවසන ලදී.

එමෙන්ම අප සභාව මූල්‍යමය වශයෙන් හොඳ තත්ත්වයක සිටින නමුත් සියලු මන්ත්‍රීවරුන්ට එක්ව සභාවට අවශ්‍ය සංවර්ධන යෝජනා සඳහා අනුමැතිය ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බවද තව ඉතා කෙටි කාලයක් පමණක් සභාවට තිබෙන අතර අද දින විරෝධතාවය පෞද්ගලික හේතුවකට කළා නොව ඉහළ පෙළේ දේශපාලන නායකත්වයට දැනුම් දීම සඳහා සිදු කළ බවද පුංචි පෙළේ නායකයින් පුංචි මිනිසුන්ගේ ගැටලු ඉදිරිපත් කළ යුතු බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් මධ්‍යම පරිසර අධිකාරිය හරහා සුරකිමු ගංගා ව්‍යාපෘතිය යටතේ කොම්පෝස්ට් අංගනය සඳහා කෝටි ගණනක මුදලක් ලැබී ඇති බවද මහමෙව්නා පාරෙන් ඉවත් කරගෙන ආ කොන්ක්‍රීට් ගල් නැවත පාවිච්චි කළේ කුමන මාර්ගයටද යන්න විමසා සිටින ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා නිරෝධායනට රැගෙන යන අවස්ථාවේදී උදේ 9 සිට සවස 2 වෙන තෙක් ක්‍රීඩාංගනයේ රැඳී සිටි බව පැවසූ අතර ඔවුන්ට අවශ්‍ය කෑම බීම ලබා දුන් බවද එතුමා සභාවේ සිටින වයස්ගතම මන්ත්‍රීවරයා වන අතර කොවිඩ් 19 ආසාදනය වීමට මුදල් බලය ආදිය අදාළ නොවන බව ද මෙය අප රටට පමණක් නොව ලෝකයටම තිබෙන ප්‍රශ්නයක් වන අතර, මෙම අවස්ථාවේ ගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම යටතේ රට පවත්වාගෙන යාම සතුටක් බවද පවසන ලදී.

තවදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, යහ පාලන ආණ්ඩුවේ ඉන්ධන සූත්‍රය මේ වන විට තිබුණනම් අද වන විට ඉන්ධන මිළ කීයදැයි විමසන ලදී. පඹහින්න රෝහලින් කොවිඩ් ආසාදියින් හමුවීම නිසා එම රෝහල නිරෝධායනයට ලක් කර ඇති බවද ගරු මන්ත්‍රීවරුන් කථා කරන විට කරුණු දැනගෙන කථා කරන ලෙසද අද දින ගරු උප සභාපතිතුමා මූලාසනය හෙඹවීම සතුටක් බවද උප සභාපතිතුමා සභාපති ධූරය දරණ සමයේදී සභාවට විශාල වැඩ කොටසක් සිදු කළ බවද පවසන ලදී.

එමෙන්ම 2019 සභාව පත්ව ආ අවස්ථාවේදීම තමන් විසින් ඇවිදින මංතීරුව පිළිබඳ යෝජනාව ගෙන ආ බවද මේ වන විට එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට හැකි වීම පිළිබඳව සතුටු වන බවද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින්, අද දින සභාවේදී ජනතාවට ඉන්ධන සහනය නොදුන් බවට මන්ත්‍රීවරු චෝදනා කළ නමුත් පවතින ආණ්ඩුව පත්වන විට රජයේ වාර්ෂික ආදායම බිලියන 1800 ක්ව පැවති බව ද මේ වන විට රජයේ ආදායම බිලියන 1200 දක්වා අඩු වී ඇති අතර එයට හේතුව වන්නේ රජය විසින් ලබා ගත් වැට් බදු ආදායම බිලියන 600 සහනය ජනතාවට ලබා දීම නිසාවෙන් බව ද පවසන ලදී. එමෙන්ම මේ වනවිට රට තුළ සහල් නොමැති බවට භීතිකාවක් මවා ඇති නමුත් මෙම රජය විසින් සහල් නිෂ්ලානදය 15% කින් වැඩි කළ බව ද සහල් වෙළෙන්ඳන් විසින් සහල් සඟවා තබා ගන්නා බැවින් සහල් මිළ පාලනය කිරීමට නොහැකි තත්ත්වයක් රජයට උදා වී ඇති බව ද පවසන ලදී.

එමෙන්ම රජය විසින් මේ වන විට කාබනික පොහොර නිෂ්පාදනයට යොමුව ඇති අතර රසායනික පොහොර භාවිතය නතර කිරිමට තීරණයක් ගෙන ඇති බවද එක පාරටම පොහොර නතර කිරීම පිළිබඳව ජනතාව විසින් රජයට චෝදනා කළ නමුත් එසේ නොකළේනම් මෙම ව්‍යාපෘතිය අසාර්ථක වන බවද රජය විසින් එක් ස්ථාවරයක සිටින අතර මේ කන්නයට අවශ්‍ය පොහොර ගොවීන් වෙත ලබා දී ඇති බව ද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර සෙනෙවිරත්න මැතිතුමා, රජයේ වෛද්‍ය සංගම් විසින් පෙන්වා දී ඇති පරිදි වාර්ෂිකව ලංකාවේ 5000ක 6000 ක ප්‍රමාණයක් වකුගඩු රෝගයෙන් මිය යන බවද වාර්ෂිකව වකුගඩු රෝගීන් 150,000 ක ප්‍රමාණයක් නිර්මාණය වන බවද පවසන ලදී. එමෙන්ම යූරියා පොහොර වලට දෙවන ලෝක යුද්ධ සමයේ හිට්ලර් විසින් මිනිස්සු මැරීම සඳහා යොදා ගත් රසායනික ද්‍රව්‍ය අන්තරගත කර ඇති අතර ඩී.එස්.සේනානායක මහතා විසින් 1965 දී හරිත විප්ලවය ආරම්භ කළ බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා, රට තුළ ජනගහනයේ වර්ධනයට සාපේක්ෂව ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට රසායනික පොහොර වැඩිපුර යෙදීම නිසා පසේ සිටින සියලු ක්ෂුද්‍ර ජීවීන් මැරී පස සම්පූර්ණයෙන්ම මැරී ඇති බවද පොහොර නොමැති වුවද 70%ක් එලදාව හැදෙන සාරවත් පසක් මෙරට ඇති බවද රසායනික පොහොර නතර කිරීම විශේෂඥයින් විසින් ලබා ගත් තීන්දුවක් වන අතර පස ආම්ලිකද නැතහොත් භාෂ්මිකද යන්න පරීක්ෂා කිරීම සඳහා පස පරීක්ෂා කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති බවද පවසන ලදී.

එමෙන්ම ඈත අතීතයේ සිටි අපේ මුතුන් මිත්තන් වස විස නැති ආහාර පමණක් වගා කළ අතර වර්තමානය වන විට මෙය ව්‍යාපාරයක් බවට පත්ව ඇති බවද ගොවිතැන පසු කාලීනව කෘෂි විද්‍යාව බවටත් පසුව එය කෘෂි තාක්ෂණය බවටත් මේ වන විට කෘෂිකර්මය බවටත් පත්ව ඇති බව පවසන ලදී.

අද ගොවියන් රසායනික පොහොරම ඉල්ලා නොසිටින අතර ඔවුන්ට අවශ්‍ය වන්නේ කුමන හෝ පොහොර වර්ගයක් බවද හෙක්ටයාරයකට කාබනික පොහොර කිලෝ පහක් යෙදීමේ ක්‍රමවේදය ලංකාවට ගෙන ඒමට කටයුතු කරන බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා රජය වාර්ෂිකව බිලියන 65 ක් පොහොර සහනාධාරයට වියදම් කරන බවද විපක්ෂය කොතරම් කෑගැසුවද මෙම රජය පෙරළීමට ඔවුන්ට නොහැකි අතර මෙම රජය විසින් රසායනික පොහොර භාවිතය නතර කර කාබනික පොහොර හඳුන්වා දී වකුගඩු රෝගීන් අවම කර සෞභාගයේ දැක්ම කරා රටගෙන යන බවද පවසන ලදී.

**10. අවසානය**

**ගරු උප සභාපති එම්.ටී.එම්.රුෑමි මැතිතුමා**

අද දින ගරු සභාපතිතුමා හදිසියේ අසනීප වීම නිසා තමන් මුලසුන හෙඹවූ අතර එහිදී සියලු දෙනාගෙන් ලැබුණු සහයෝගය සඳහා ස්තුතිය පළ කරන ලදී. නීත්‍යානුකලව ඉටු කළ හැකි සියලු යෝජනා පක්ෂ පාට භේදයකින් තොරව ස්ථිර කර අනුමත කළ අතර නීත්‍යානුකලව කළ නොහැකි යෝජනා පමණක් අනුමත නොවූ බව පවසන ලදී. එමෙන්ම කාපට් ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා මාර්ගවලින් ගලවා ඉවත් කරන ලද කොන්ක්‍රීට් ගල් මොහාන් සාලිය එල්ලාවල මාවතේ ඇති යාඩ් එකේ ගබඩා කර ඇති බවද එම ගල් නැවත භාවිතයේදී සභා අනුමැතිය ලබා ගැනීමෙන් පසු මාර්ගවලට යොදවන බවද පවසන ලදී.

අද දින සභාව කරගෙන යාම සඳහා සහයෝගය ලබා දුන් ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා ඇතුලු කාර්ය මණ්ඩලයට ස්තුතිය පළ කරමින් අද දින සභාවේ වැඩකටයුතු ප.ව 2.30 ට පමණ අවසන් කරන ලදී.

එම්. ටී. එම්. රුෑමි,

උප සභාපති,

බළන්ගොඩ නගර සභාව